**උකුවෙල ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 25 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 12 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ). එකතුව රු.137,557 ක්වූ වියදම් ණයහිමි ශේෂයන් හා රු.4,348,549ක කර්මාන්ත ණයහිමි ශේෂයන් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. මීට අමතරව එකතුව රු.1,090,485ක් වූ ණයගැති ශේෂයන් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ). 2013.12.31 දිනට උකුවෙල මහජන බැංකුවේ ඇති රු.2,261,745ක් වූ ස්ථාවර තැන්පතු ශේෂය ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය කිරීම සඳහා අවස්ථා 11කදී ගෙවා ඇති රු.2,051,561ක් හා පොදු වෙළඳපොළ ඉදිකිරීමේ දෙවන අදියර සඳහා එකතුකල බදු මුදල් වශයෙන් රු.289,029ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ). දිඹුරුවෙල පොදු සුසාන භූමිය පිහිටි පර්චස් 30ක ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. පිළිසරු ව්‍යාපෘතිය යටතේ ඉකුත් වර්ෂයේ ඉදිකර තිබුණු පිරිවැය රු.1,618,312ක් වූ ගොඩනැගිල්ලේ වටිනාකම නැවත වරක් සමාලෝචිත වර්ෂයේදී ද ගිණුම් ගතකර තිබුණි.

(ඉ). ස්ථාවර වත්කම් ගිණුම් 03කට අයත්, විෂයයන් 10ක අගය වූ රු.354,055ක්, එම ගිණුම්වලට අමතරව මිශ්‍ර ගබඩා තොග ගිණුමෙහිද ඇතුලත් කර තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.366,111 ක ඖෂධ තොග හා රු.117,853 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල වටිනාකම ගිණුම් ගතකර නොතිබුණු අතර, පුස්තකාල පොත් ශේෂය රු.14,253 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

1.3.4 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

එකතුව රු.39,483,822ක් වූ ගිණුම් විෂයයන් 02කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.15,729,182 ක් විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ලැබිය යුතු ගිණුම්

---------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.2,430,068ක් වූ අතර,ඊට වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවූ රු.142,180ක්වූ ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

---------------------

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණයහිමි ශේෂ 02ක එකතුව රු.15,569,965ක් වූ අතර, ඊට වර්ෂයකට වැඩි කාලයක් ඉක්මවූ රු.1,988,487ක ශේෂ ඇතුළත් වී තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.461,940 වූ ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 නීති,රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි චක්‍රලේඛ විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ132 ( ඒ) හා (ඕ) වගන්ති | යොමුගත විධිවිධානවලට අනුකූල නොවී නියමිත සීමාවන් ඉක්මවා අවස්ථා 04 ක දී රු. 31,440 ක වියදම් දරා තිබුණි. |
| (ආ). | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 99 රීතිය. | රු.463,867ක් සඳහා වූ සහතික නොකරන ලද වවුචර්පත් 16ක් සඳහා ගෙවීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ). | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | ප්‍රාදේශීය සභාව සතු වාහන 05 ක ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. |
| (ඈ). | 2013 අප්‍රේල් 05 දිනැති අංක 01/2013 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය. | දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකරන ලද උපසභාපතිවරයාට සහ මන්ත්‍රීවරු 12දෙනෙකුට රු.185,000ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,436,943ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,201,653ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,764,710ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 වරිපනම් හා අක්කර බදු

--------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු හා අක්කර බදු ශේෂ පිළිවෙලින් රු.817,626ක් හා රු.31,431ක් වූ අතර, එම ශේෂවලට වර්ෂ 05ක කාලයක් ඉක්මවූ පිළිවෙලින් රු.110,945ක හා රු. 31,235ක ශේෂ ඇතුළත් විය.

#### 2.2.2 ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජලගාස්තු ගිණුමේ ශේෂය රු.1,310,485ක් විය.

2.2.3 බදු කුලී

----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදුකුලී ගිණුමේ ශේෂය රු.251,965ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,364,434ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.8,821,264ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.3 අධිභාර

---------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂයකදී පනවන ලද අධිභාරවලට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට රු.86,970ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1. මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය අනුව, ගොඩනැඟිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුන තුළ ලැබී තිබුණු අයදුම්පත් 1305 කින් 953 ක් අනුමත කර තිබුණු නමුත්, ඉන් අයදුම්පත් 121 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

(ආ). භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, පිරිවැය රු.46,450ක්වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 41 ක ඌනතාවයක් සහ රු. 15,365 ක් වු වෙන්දේසි කළයුතු භාණ්ඩ වර්ග 65 ක් හඳුනාගෙන තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුළ බලපත්‍ර නිකුත් කළ යුතු වෙළඳසැල් 386 ක් හඳුනාගෙන බලපත්‍ර ගාස්තු අයකර ගෙන තිබුණු නමුත්, ඉන් වෙළඳසැල් 277ක් සඳහා පමණක් බලපත්‍ර ලබා දී තිබුණි. ඉතිරි වෙළඳසැල් 109 බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු වල නිරත වී තිබුණි.

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). කඩකාමර බදු දීම

---------------------

(i) පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 දරන 1980 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛයේ 01 හා 03 ඡේදයන්ට අනුකූල නොවී පැරණි වෙළෙඳපොලේ කඩකාමර සඳහා මුලින් එකඟ වූ රු.750ක ගිවිසුම්ගත වටිනාකමටම බදුකරුවන් 10 දෙනෙකුට නව වෙළෙඳපොලේ කඩකාමර පවරා දී තිබුණි.

(ii) යථෝක්ත චක්‍රලේඛයේ 07 ඡේදය අනුව,ගිවිසුම් කොන්දේසි කඩ කිරීම මත ගිවිසුම අවලංගු කළයුතු බව සඳහන්ව ඇතත්,කඩ කාමර 4 ක් අතුරු බදුදී තිබුණු බදුකරුවන්ගේ බදු ගිවිසුම් අවලංගු කිරිමට හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ). සභාවට අයිතියක් නොමැති ඉඩම් දෙකක් තුල රු. 272,337 ක වියදම් දරා ඉදිකිරීම්, සිදු කර තිබුණි.

3.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

2010 වර්ෂයේ සිට පොදු වෙළඳපොල සංකීර්ණයේ කඩකාමර 06ක් වසාදමා තිබුණු අතර, 2010 නොවැම්බර් මස ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස සභාවට ලැබී තිබූ ධූමායන යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | ප්‍රතිපාදන | කර්මාන්තයේ නම | වැයකර තිබුණු මුදල | භෞතිකව පරීක්ෂා කළ දිනය | අඩුපාඩුව |
|---|---|---|---|---|---|
| | --------- | ---------------- | ----------- | -------------- | ------------ |
| | | | රු. | | |
| (අ) | i.පොදු අරමුදල් | බෝධිරාජ මාවත අවසාන කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම. | 65,448 | 2013.11.19 | (i) මාර්ගය ස්ථාන කීපයකින් කඩා පරීක්ෂා කිරීමේදී කොන්ක්‍රීට් මිශ්‍රනය ඉතා දුර්වල තත්ත්වයක වූ බව නිරීක්ෂණය විය.<br>(ii) කොන්ක්‍රීට් මිශ්‍රනය සඳහා අඟල් 1½ ගල් යෙදිය යුතු වුවත් අඟල් 2 හා ඊට වැඩි ගල් යොදා තිබුණි. |
| | ii.- එම- | තාලිංගාමඩ වටගොඩ 16කණුව දක්වා මාර්ගය සංවර්ධනය කිරීම. | 184,989 | 2014 .10.28 | මාර්ගය ස්ථාන 2 කින් කඩා පරීක්ෂා කිරීමේදී කොන්ක්‍රීට් මිශ්‍රනය නියමිත ප්‍රමිතියට නොතිබුණි. |
| | iii.- එම- | රත්වත්ත පහළ කොටසේ පෙර පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම. | 223,105 | 2014.10.28 | (i) ගොඩනැඟිල්ලෙහි රත්වත්ත ශ්‍රී මුත්තුමාරි අම්මාන් දේවාලයේ කපු මහතා සිය පවුලේ සාමාජිකයින් සමඟ පදිංචි වී සිටි අතර, පෙර පාසැලක් ආරම්භ කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | (ii) පාවිච්චි කළ පැරණි ඇස්බැස්ටෝස් ෂීට් 6ක්ද වහලයට යොදා තිබුණි.<br>(iii). ඉදිකිරීම කර තිබූ භූමිය සහාවට පවරාගෙන නොතිබුණි. |
| (ආ) | i.මග නැඟුම | ආනන්ද ජනපද පාර කොන්ක්‍රීට් කැටගල් අල්ලා වැඩි දියුණු කිරීම. | 500,000 | 2014.10.28 | (i) මීටර් 94.5ක් දිගට කැටගල් ඇතිරීම සඳහා ගෙවීම් කර තිබුණු නමුත්, මීටර් 92.0ක පමණක් කැටගල් ඇතිරීම නිසා මීටර් 2.5ක් සඳහා රු.11,306ක් වැඩිපුර ගෙවා තිබුණි.<br>(ii) ඇතැම් ස්ථානවල ප්‍රමිතියට අනුව ගල් අතුරා නොතිබුණි. |
| | ii. එම | තාලිංගාමඩ වටගොඩ පාර කැටගල් අල්ලා වැඩිදියුණු කිරීම. | 500,000 | 2014.10.28 | මීටර් 93.30ක් දිගට කැටගල් ඇතිරීම සඳහා ගෙවීම් කර තිබුණු නමුත්, මීටර් 92.20ක පමණක් කැටගල් ඇතිරීම නිසා මීටර් 1.1ක් සඳහා රු.4,642ක් වැඩිපුර ගෙවා තිබුණි. |

3.5 සන අපද්‍රව්‍ය කළමනාකරණය
-------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 03ක පමණ සන අපද්‍රව්‍ය වලින් වෙන්කරන ලද සන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1-1½ත් අතර ප්‍රමාණයක් දෙමටගොල්ල කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට භාර දෙන අතර, ඉතිරි අපද්‍රව්‍ය පරිසරයට හානිවන අයුරින් උකුවෙල හා ඇල්කඩුව ප්‍රදේශයේ පිහිටි සභාව සතු ඉඩම් දෙකකට බැහැර කරන බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මඟින් වැය විෂයයන් 18ක් සඳහා සලසාදී තිබූ රු.780,000ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම හෝ ඉතිරි කිරීම සිදුකර තිබුණු අතර, තවත් වැය විෂයයන් 50කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය සහ වියදම අතර සියයට 20 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ආදායම් විෂයයන් 30ක ඇස්තමේන්තුගතරු.8,627,500 ආදායමෙන් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 13ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 54 සිට සියයට 92 අතර පරාසයක විචලනයන් පැවතුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) . අයවැය පාලනය.
(ආ). වත්කම් කළමනාකරණය.
(ඇ). ගබඩා පාලනය.
(ඈ). ණයගැති හා ණයහිමි පාලනය.
(ඉ) . අභ්‍යන්තර පාලනය.
(ඊ) . මූල්‍ය කළමනාකරණය.